# සුවිශේෂක සාන්ත ජොහන් අපෝස්තුළු තුමාගේ

**මංගල්‍යය**

## පළමුවන දේව ප්‍රකාශනය 1 ජොහන් 1:1–4

*ශුද්ධ වූ ජොහන් තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් සුවිශේෂක ජොහන් තුමන් විසින් ලියන ලදි.*

අපි ඇසූ දුටු දේ ගැන සාක්ෂි දරමු.

මුලාරම්භයේ පටන් වූ ජීවනයේ ධර්මයාණන් ගැන අපි ඔබට ලියමු. අපි උන් වහන්සේ කතිත් ඇසීමු, අපේ ඇස් වලින් දුටිමු: දැක බලා, අපේ අත්වලින් ස්පර්ශ කෙළෙමු. මේ ජීවනය දාශ්‍යමාන විය. අපි ඒය දැක, ඒ ගැන සාක්ෂි දරමින්, පියාණන් වහන්සේ සමග වැඩවිසූ, අපට දෘශ්‍යමාන කරන ලද සදාතන ජීවනය ඔබට ප්‍රකාශ කරමු. අප ඔබටත් ප්‍රකාශ කරන්නේ අප ඇසූ දුටු දේ ම ය. අප එසේ කරන්නේ, පියාණන් වහන්සේ ද උන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ද සමග පවත්නා අපේ සහභාගිකමට ඔබත් පංගුකාර වන පිණිස ය. තවද, අප මෙය ලියන්නේ අප හැමගේ ප්‍රීතිය සම්පූර්ණ වන පිණිස ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 97: 1–2, 5–6, 11–12

පිළිතුර : සැදැහැවතුනි, සමිඳුන් තුළ ප්‍රීති ප්‍රමෝද වන්න.

ගීය : සමිඳාණෝ රජකම් කරන සේක. මිහිතලය ප්‍රීති වේ වා!
දිවයින් සියල්ල ප්‍රීති ප්‍රමෝද වේ වා!
වලාකුළු සහ අඳුර එතුමන් වට කර සිටින්නේ ය.
දැහැමිකම සහ යුක්තිය එතුමන්ගේ සිහසුනේ පදනම් ය.

කඳු හෙල් සමිඳාණන් දැක ඉටි මෙන් උණු වන්නේ ය:
මුළු මිහිතලය ද සමිඳුන් දැක එසේ වන්නේ ය.
දෙව්ලොව එතුමන්ගේ සාධාරණකම ප්‍රකාශ කරන්නේ ය.
සකල ජනතාවෝ එතුමන්ගේ මහිමය නරඹන්නෝ ය.

දැහැමියන් මත එළිය බබළයි: යහපත් අය මත සතුට දිළිසෙයි.
සැදැහැවතුනි, සමිඳුන් තුළ ප්‍රීති ප්‍රමෝද වෙත් වා!
එතුමන්ගේ සුවිශුද්ධ භාවය සිහි කොට
එතුමන්ට ප්‍රශංසා කරත් වා!

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
දෙවිඳුනි, අපි ඔබ පසසමු. ඔබ අපේ සමිඳුන් බව පිළිගනිමු.
සමිඳුනි, ප්‍රේරිතවරුන්ගේ ප්‍රතාපවත් පිරිස ඔබ පසසන්නෝ ය.
ආලේලූයා!

## සුවිශේෂය ජොහන් 20: 1–8

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

අනෙක් ශ්‍රාවකයා පේදුරු පසුපස දුවගොස්
පළමුවෙන් සොහොන් ගෙට පැමිණියේ ය.

සතියේ පළමු වන දා හිමිදිරියේ ම, අඳුර තිබිය දී මග්දලාවේ මරියා සොහොන් ගෙය ළඟට අවුත්, සොහොන් ගෙයින් ගල ඉවත් කොට තිබෙන බව දුටු වා ය. එබැවින් ඈ සීමොන් පේදුරු ද ජේසුස් වහන්සේ ප්‍රේම කළ අනික් ශ්‍රාවකයා ද වෙත දුව ගොස්, "ඔවුන් සමිඳාණන් වහන්සේ සොහොන් ගෙයින් ඉවතට ගෙන ගොස් තිබේ: ඔවුන් උන් වහන්සේ කොතැනක තැබුවා ද කියා අපි නොදනිමු"යි කීවා ය. එවිට පේදුරු ද අනික් ශ්‍රාවකයා ද නික්ම විත් සොහොන් ගේ දෙසට ගියහ. දෙදෙනා ම එක් ව දිව්වෝ ය.

අනික් ශ්‍රාවකයා පේදුරු පසු කර දුව ගොස් පළමුවෙන් සොහොන් ගෙට පැමිණ, නැමී බලා, සිහින් හණ රෙදි එහි තිබෙන බව දිටී ය. එහෙත් ඔහු ඇතුළට නොගියේ ය. සීමොන් පේදුරු ඔහුට පසුව පැමිණ සොහොන් ගේ ඇතුළට ගොස්, හණ රෙදි එහි තිබෙන බවත්, උන් වහන්සේගේ හිස ඔතා තිබූ රෙදි කඩ, හණ රෙදි සමඟ නොව, වෙන ම එක් තැනෙක අකුළා තිබෙන බවත් දුටුවේ ය. එකල සොහොන්ගේ ළඟට පළමුවෙන් පැමිණි ඒ අනෙක් ශ්‍රාවකයා ද, ඇතුළට ගොස් දැක විශ්වාස කෙළේ ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*